# ධර්මදූත විද්‍යාලය - බදුල්ල
## අවසාන වාර පරීක්ෂණය - 2017
## ඉතිහාසය

6 ශ්‍රේණිය　　　　　　　　　　　　　　　　　　　කාලය -: පැය 02යි.

**1 කොටස**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකි වන්නේ,
I. නටබුන්　　II. කාව්‍ය　　III. කාසි

(2) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති පැරණිතම වානරයා,
I. ඔස්ට්‍රලෝපිතිකස්　　III. හෝමෝ ඉරෙක්ටස්
II. හෝමෝ හැබිලස්

(3) මහවංශයේ සඳහන් පරිදි විජය කුමරු මෙරටට ගොඩබසින විට මෙහි ජීවත් වූ ජන කණ්ඩායම,
I. අමනුෂ්‍යයන් ය.　　II. යක්ෂයන් ය.　　III. වානරයන් ය.

(4) විජය කුමරු මෙරටට පැමිණෙන විට මෙරට පැවති නගර දෙක වන්නේ,
I. තම්මැන්නාව හා උරුවෙල　　III. සිරිසවත්ථුව හා ලංකාපුරය
II. මාගම හා ජම්බුකෝල පට්ටන

(5) පණ්ඩුකාභය රජතුමාගේ පියාගේ නම,
I. මුටසීව　　II. දිඝගාමිණී　　III. කාවන්තිස්ස

(6) " කම්මාරදේව '' නැමැති දෙවියා වෙනුවෙන් පණ්ඩුකාභය රජතුමා කළ සේවාවක් වන්නේ,
I. පෙරහැරක් පැවැත්වීම.　　II. ගමක් තෑගී දීම.　　III. දේවාලයක් සෑදීම.

(7) ලම්භකරණ රජ පෙළපතේ ආරම්භකයා,
I. වළගම්බා රජතුමා　　III. දේවානම් පියතිස්ස රජතුමා
II. වසභ රජතුමා

(8) නාගරික ජීවිතයට මිනිසුන් හුරු වූ යුගය,
I. පුරාශිලා යුගය　　II. මධ්‍ය ශිලා යුගය　　III. නව ශිලා යුගය

(9) මහසෙන් රජතුමා විසින් ඉදිකළ ජේතවනාරාම තුළ තැන්පත් කර ඇත්තේ බුදුන් වහන්සේගේ,
I. ශාරීරික ධාතූනව　　II. පරිධාතුව　　III. වම් හකු ධාතුව

(10) එළාර රජු හා දුටුගැමුණු රජු අතර මුහුණට මුහුණලා සටන් සිදු වූයේ,
I. මාගම දීය.　　II. අනුරාධපුරයේදීය　　III. විජිතපුරයේදීය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු වරහන් තුලින් තෝරා හිස්තැන් පුරවන්න.**

(11) මින්නේරි වැව පුරාණ කාලයේ හැඳින්වූයේ ........................................................ වැව යනුවෙනි.
(බානු / මිණිහිර)

(12) වර්ෂ දහ අටක කාලයක් මෙරට පාලනය කළේ ................................................රජතුමාය.

( ධාතුසේන / වලගම්බා )

(13) රුවන්වැලි සෑයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළේ ................................................ රජතුමා ය.

( දුටුගැමුණු / සද්ධාතිස්ස )

(14) මිනිසුන් වනයේ තැනින් තැන ඇවිදිමින් ............................................වැනි සතුන් දඩයම් කළ යුගයක් මෙරට පැවැතිණි. ( හාවුන් සහ දඬුලේනුන් / සිංහයන් හා අශ්වයන් )

(15) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විසූ ජනතාව .................................... භාවිතා කරන නිවාස තැනූහ.

( පිළිස්සූ මැටි ගඩොළු / කිරිගරුඬ )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල වාක්‍ය නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) වැරදි ලකුණ ද ඉදිරියේ වරහන් තුළ යොදන්න.**

(16) වළගම්බා රජතුමාගේ බිසව සෝමා බිසවයි. ( )

(17) ධාතුසේන රජතුමා මෞර්ය වංශයට අයත් වේ . ( )

(18) අනුරාධපුරයේ ලෝවාමහාපාය සාදවන ලද්දේ දුටු ගැමුණු රජතුමා විසින් ය . ( )

(19) ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවූයේ අනුලා දේවියයි. ( )

(20) නගුලෙන් සී සෑමේ ක්‍රමය මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ පැවතිණ. ( )

( ලකුණු 20x2 = 40)

## 11 කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

( 01 ) පහත දැක්වෙන රූප රාමු අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



I. ඉහත රූප රාමුවේ දැක්වෙන ස්තූපය නම් කරන්න.
II. මෙම ස්තූපය ඉදි කළ රජතුමා කවුරුන්ද ?
III. මෙම ස්තූපයේ උස අඩි කොපමණ ද ?
IV. මෙම ස්තූපයේ තැන්පත් කර ඇත්තේ බුදුන් වහන්සේගේ කුමන ධාතුව ද? ( ලකුණු 12යි )

( 02 )

I. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ දී ජනාවාස වී පැවති ගල්ලෙන් තුනක් සඳහන් කරන්න.

II. දඩයම්කරුවන් විසින් බෙලි කටුවක් විද සකස් කරගත් ගෙලෙහි පලඳින තැල්ලක් හමුවූ ස්ථානයක් නම් කරන්න.

III. පැරණි සතුන්ගේ ඇටකටු වලින් නිර්මාණ කළ උපකරණ දෙකක් සඳහා නිදසුන් ලබාදෙන්න.

IV. මුල් ජනාවාසවල සිටි මිනිසුන් දඩයම් කළ සතුන් වර්ග හතරක් ලියන්න. ( ලකුණු 12 )

( 03 )

I. දුටු ගැමුණු රජතුමාගේ පියාගේ සහ මවගේ නම් ලියන්න.

II. දුටුගැමුණු රජතුමා කුඩා කල ජීවත් වූ රාජධානිය කුමක්ද ?

III. කාවන්තිස්ස රජතුමා සද්ධාතිස්ස කුමරාට පැවරූ විශේෂ වගකීම පැහැදිලි කරන්න.

IV. දුටුගැමුණු රජතුමා ඉදිකල වෙහෙර විහාර තුනක් ලියන්න. ( ලකුණු 12 )

( 04 )

I. වසභ රජතුමා ඉදි කරවන ලද වැව් පිහිටි දිස්ත්‍රික්කය නම් කරන්න.

II. වසභ රජතුමා ඉදි කරවන ලද වැව් දෙකක් ලියන්න.

III. වසභ රජතුමා රට පාලනය කළ ආකාරය සඳහන් වන රන් පත් ඉරුවේ නම කුමක්ද ?

IV. වසභ රජතුමා ප්‍රතිසංස්කරණය කළ වෙහෙර විහාර තුනක් ලියන්න. ( ලකුණු 12 )

( 04 )

I. ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධි සහිත ග්‍රන්ථ ලියූ ලේඛකයන් සිටි රටක් නම් කරන්න.

II. ඉහත සඳහන් කළ රටෙන් මෙරටට ලැබුණු දායාදයන් සඳහන් කරන්න.

III. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිම කෘතිය කුමක්ද?

IV. ඉතිහාසය දැන ගැනීමට උපයෝගී වන සෑම දෙයක් ම හඳුන්වන පොදු නම කුමක් ද? ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජන දෙවර්ගය නම් කරන්න.

( ලකුණු 12 )

( 05 )

I. ලාවා යනු මොනවාද?

II. පෘථිවියේ බිහිවූ පළමු ක්ෂුද්‍ර ජීවියාගේ නම කුමක්ද?

III. තිහාරිකාවක් යනු කුමක් ද?

IV. පෘථිවියේ මැද කොටසේ උණුසුම කොපමණද? ( ලකුණු 12 )

( 06 )

I. ක්‍රිස්තු පූර්ව කාලය යනු කුමක්ද ?

II. බුද්ධ වර්ෂ ආරම්භ වීමට බලපෑ සිදුවීම කුමක්ද?

III. මහා වංශය රචනා කළේ කවුද?

IV. ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු වර්ෂය ක්‍රිස්තු වර්ෂ ක්‍රමයට දක්වන්න. ( ලකුණු 12 )